Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# අක්මීමන ප්‍රාදේශීය සභාව

01. දකුණු පළාත් රාජ්‍ය සේවයේ අක්මීමන ප්‍රාදේශීය සභාවි දැනට පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර ව පදිංචි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයෙන් ම අයදුම්පත් කැඳවනු ලැබේ.

| 02. තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අවම අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|
| ආදහනාගාර සහායක | 01 | PL1 - 2016<br>රු. 24,250 - 250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 36,410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්වීම. |
| පුස්තකාල සහායක | 01 | PL1 - 2016<br>රු. 24,250 - 250 x 10 - 270 x 10 - 300 x 10 - 330 x 12 - රු. 36,410 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්වීම. |

03. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ. මෙම අය අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් තම අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(iii) අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක කාලයක් දකුණු පළාත් බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි ඇති අයෙකු විය යුතු ය.

(iv) අයදුම්කරුවන් මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.

(vi) අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(vii) අයදුම්කරුවන් ඒ ඒ තනතුරු ඉදිරියේ දක්වා ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසාන දින වන විට සපුරා තිබිය යුතු ය.

04. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය. වැන්දඹු පුරුෂ/අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(ii) අක්මීමන ප්‍රාදේශීය සභාවේ දැනට සේවයේ නියුතු තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

(iii) තෝරාගනු ලබන්නේ වසර තුනක පරිවාස කාලයකට යටත්ව ය.

(iv) ඉහත සඳහන් කර ඇති බඳවා ගැනීමේ කොන්දේසිවලට හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, දකුණු පළාත් සභව, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා අක්මීමන ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරනු ලබන වෙනත් නියෝග හා රෙගුලාසිවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

05. *බඳවා ගන්නා ක්‍රමය :* අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදළ බඳවා ගැනීමේ පරිපාටියේ ඇමුණුම් අංක 01 අනුව පහත සඳහන් පරිදි උපරිම ලකුණු මත බඳවා ගනු ලැබේ.

| | *ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 02 | අමතර සුදුසුකම් (උපලේඛන 02ට අනුව අදළ නම්) | 10 | |
| 03 | පළපුරුද්ද (උපලේඛන 02ට අනුව අදළ නම්) | 10 | |
| 04 | සභා බල ප්‍රදේශයේ පදිංචිය (එක් වසරකට ලකුණු 05 බැගින්) | 45 | |
| 05 | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

*සටහන :*

01 මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දීම සිදු කෙරේ.

02. මූලික සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලැබූ ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

06. *අයදුම් කළයුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි 12" x 8" (A4) ප්‍රමාණයේ කඩදසියක පිළියෙල කර ගන්නා අයදුම්පත් 2018.08.20 දිනට පෙර ලැබෙන සේ සභාපති, අක්මීමන ප්‍රාදේශීය සභාව, අක්මීමන යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර ඉල්ලුම් කරන තනතුර පැහැදිළිව සඳහන් කළ යුතු ය. දක්වා ඇති උපදෙස්වලට පටහැනි ව අසම්පූර්ණ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපතක අමුණා එවිය යුතු ය.

(i) උප්පැන්න සහතිකය,

(ii) අධ්‍යාපන සහතික/ශිෂ්‍ය කාර්ය දර්ශකය

(iii) පදිංචිය සනාථ කිරීමේ සහතිකය (අදළ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිතව මාස 06 ක් තුළ ලබා ගත් ග්‍රාම සේවා සහතිකය)

(iv) මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක්

(v) වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික (තිබේ නම්)

(vi) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික

08. මෙම අයදුම්පත කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම් හෝ වෙනස් කිරීම් සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී බලතල අක්මීමන ප්‍රාදේශීය සභාවේ සභාපති සතු ය. දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතුය.

2018 ක් වූ ජුනි මස 28 වැනි දින,
අක්මීමන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

සමරසේන කළුහෙවත්ත,
සභාපති,
අක්මීමන ප්‍රාදේශීය සභාව.

## ආදර්ශ අයදුම්පත්‍රය

*දකුණු පළාත් රාජ්‍ය සේවයේ අක්මීමන ප්‍රාදේශීය සභාවේ අදහනාගාර සහායක/පුස්තකාල සහායක තනතුර සඳහා අයදුම්පත*

01. (i) මුලකුරු සමග නම :——————————.
    (ii) මුලකුරු වලින් හැඳින්වෙන නම :——————————.

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————.

03. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————.

04. ස්ථිර පදිංචි ලිපිනය :——————————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————.

07. උපන් දිනය : වර්ෂය:———— මාසය :———— දිනය:————

08. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු :———— මාස :———— දින :————

09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? :——————————.

10. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) : (සහතිකවල පිටපත් අමුණන්න.)
    ——————————————————————
    ——————————————————————.

11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් : (සහතිකවල පිටපත් අමුණන්න.)
    ——————————————————————.

12. ඉල්ලුම්කරු දැනට රැකියාවක නියුතු නම්,
    (i) තනතුර:——————————.
    (ii) සේවය කරන ස්ථානය:——————————.
    (iii) පත්වීම් දිනය:——————————.

13. ඔබ කවරදක හෝ සාපරාධී වරදක් හෝ චෝදනාවක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරුවකු කරනු ලැබ තිබේද?
    :——————————.

14. අයදුම්කරුගේ සහතිකය : මෙම අයදුම්පතේ මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගු වීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැති ව සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

15. රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.

මෙම අයදුම්කරු දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවයේ නියුක්ත බව ද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම් සතුටුදායක බවද, මෙම තනතුර සඳහා තෝරා ගතහොත් දැනට දරන තනතුරෙන් ඔහු/ඇය නිදහස් කළ හැකි/නොහැකි බව ද ප්‍රකාශ කරමි.

————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————————